**ශීර්ෂය 216 -සමාජ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 216- සමාජසේවා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාජසේවා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | 128(1) ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 128 (1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබීම<br>2.ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් | 2.7<br>2.1.1 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිරාදිය උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම | 2.2 (ආ) |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් | 2.6 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

කොට්ටාව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 25 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2017 ජනවාරි මාසයේ දී ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ඉදිකිරීම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් විය යුතුව තිබුණි. කෙසේ වුවද මේ සඳහා රු.මිලියන 16 ක් ඉදිකිරීම් කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණද 2018 ඔක්තොබර් 18 දින දක්වාම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 08 ක එකතුව ඉඩම් හෙක්ටර්යාර් 22 ක් 2018 ජුනි 30 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2017 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා වෘත්තිය පුහුණු ආයතනයක භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ අයිතම 16 ක ඒකක 38 ක් වූ අතිරික්තතා හා භාණ්ඩ අයිතම 16 ක ඒකක 289 ක ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 හා 108 පරිදි කටයුතු කර නොතිබුණි.

### 2.3 බැදීම් හා බැරකම්

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 384.18 ක ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4.79 කින් ඉක්මවා රු.7.05 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

## 2.4 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2011 මාර්තු 10 දින තනතුරු අනුමත කිරීමේදී, යටපත්වන තනතුරු සඳහා ස්ථානභාර නිලධාරී තනතුරු මගින් රාජකාරී ඉටුකරවා ගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් අහෝසි කරන ලද තනතුරුවල වැඩබැලීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත්කර දීමනාව වශයෙන් 2011 මාර්තු මාසයේ සිට 2017 පෙබරවාරි මාසයේ දක්වා රු.441,766 ක් ගෙවීම් කර තිබුණි.

**(ආ)** සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරීන් 6 දෙනෙකුගේ බාලවයස්කාර දරුවන්ට අයත් රු.186,491 ක ඉතිරිකිරීමේ පාස් පොත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඔවුන් වෙත නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 02 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2016 | පුනරාවර්තන | 446.33 | 434.92 | 11.40 | 2.56 |
| | මූලධන | 50.10 | 48.89 | 1.21 | 2.42 |
| | **එකතුව** | **496.43** | **483.82** | **12.61** | **2.54** |
| 2017 | පුනරාවර්තන | 520.72 | 483.92 | 36.82 | 7.06 |
| | මූලධන | 180.31 | 101.66 | 78.63 | 43.61 |
| | **එකතුව** | **701.03** | **585.58** | **115.45** | **16.47** |

**විසර්ජන ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ ) අධි ප්‍රතිපාදන සලසා තිබීම

----------------------------

වැය විෂයයන් 42 ක් සඳහා එකතුව රු.මිලියන 285.404 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 212.139 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 90 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

----------------------------------------------------

ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතන වල පුහුණු ලාභී දීමනාව ගෙවීමට රු.මිලියන 25 ක පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 22.59 ක් හෙවත් සියයට 90 ක් උපයෝජනය කර නොතිබුණි.

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**------------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 216 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| **20.00** | **19.07** | **15.00** | **15.17** | **95.00** | **53.36** |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**------------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 574,813 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක් පැවතුණද, එම ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ඉන්වෙන්ට්‍රි ලේඛන | මුදල් රෙගුලාසි 751 |
| (ආ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඇ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |

## 2.8 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 334.78 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.473,518 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 07 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 117 | 110 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 521 | 471 | 50 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 116 | 108 | 08 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 18 | 11 | 07 |
| | | 782 | 707 | 75 |

2015 අප්‍රේල් 02 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරිනියක් වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සේවය කර තිබුණු අතර එම නිලධාරිනියට සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු.507,310 ක දළ වැටුප් ප්‍රමාණයක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.